දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 24/2012,

මගේ අංක:SWD/03/බ.කො/වෙ.ව.ගු/2012,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2012-08-14 වන දින.

සියළුම බන්ධනාගාර කොමසාරිස්වරුන් හා
මූලස්ථාන මාණ්ඩලික නිළධාරීන් වෙත,

<u>බන්ධනාගාර මාණ්ඩලික නිළධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් ලබා දීම.</u>

මාණ්ඩලික නිළධාරීන් හට ප්‍රවාහන පහසුකම් සැපයීමේදී 22/99 හා 1999-10-08 වන දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය දැනට ක්‍රියාත්මක වන අතර, එම පහසුකම් වැඩ බැලීමේ පදනම මත පත්කර ඇති බන්ධනාගාර කොමසාරිස්වරුන් හටද, අදාල වන සේ 2012-09-01 වන දින සිට පහත සඳහන් ක්‍රියාවන් අනුගමනය කල යුතු බව මෙයින් නියෝග කරමි.

01. තම රාජකාරි කටයුතු සඳහා සහ කාර්යාලයේ සහ නිවස අතර යාම ඊම වෙනුවෙන් නිළ වාහනයක් යොදා ගත හැක.

02. නිළ වාහනය සඳහා මසකට පෙට්‍රල් හෝ ඩීසල් ලීටර් 140 ක ප්‍රමාණයක් සඳහා අනුමත මිළ ගණන් යටතේ මුදල් ප්‍රමාණය ලබා ගත හැක.

03. නිළ වාහනය සඳහා ඉන්ධන ගැලපුම් මුදල් ලබා ගන්නා නිළධාරියකු වෙනත් සංචිත වාහන කිසිදු අවස්ථාවක පාවිච්චි නොකල යුතුය.

04. මසකට රුපියල් පන්සියක (රු:500.00) ගෙවීමක් මත පෞද්ගලික ගමන් සඳහා නිළ වාහනය පාවිච්චි කල හැක. මෙම මුදල සෑම මසකම වැටුපෙන් අයකරනු ඇත.

05. රියදුරු නොමැති වූ විට වාහනය පැදවීම සඳහා මාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු අතර, අදාල වාහනය පැදවීමට අවසර ලබා දිය හැකි වන්නේ එම ගණයේ වාහන පැදවීමට රියදුරු බලපත්‍රයක් තිබේ නම් පමණි.

06. පුද්ගලික ගමන් වෙනුවෙන් රියදුරන් හට අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීම රජයේ බරක් නොවිය යුතු අතර, එම වැය බර අදාල නිළධාරියා විසින් දැරිය යුතුය. රාජකාරිමය ගමන් සඳහා පමණක් අතිකාල හා සංයුක්ත දීමනා රජය මගින් ගෙවනු ලබන අතර, එම ගෙවීම් කිරීම සඳහා එම ගමන් රාජකාරි ගමන් බවට ඔබ විසින් පූර්ණ සහතිකයක් කල යුතුය.

පී.ඩබ්ලිව්. කොඩිප්පිලි,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

<u>පිටපත්</u>:-01. බන්ධ:කො: (මුදල්), } 2012-09-01 දින සිට ඉහත උපදෙස් අනුව
02. බන්ධ:නි:කො:(ගෙවීම්), } දීමනා වැටුපට එකතු කිරීම සඳහා.